ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය

# லிபரல் ஜனநாயக கட்சி

## Liberal Democratic Party

# ව්‍යවස්ථාව

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
லிபரல் ஜனநாயக கட்சி
**Liberal Democratic Party**


# For the future of you, your child and the country..................


අංක 583, ශා.ජුඩ් මාවත, කඳාන, ශ්‍රී ලංකාව | இல.583, புனித ஜூட் மாவத்தை, கந்தானை, இலங்கை.
No. 583, St. Jude Mawatha, Kandana, Sri Lanka.
+94 112 950 816   info@ldp.lk   www.ldp.lk

# ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ව්‍යවස්ථාව

## පූර්විකාව

ශ්‍රී ලංකාවේ ලිබරල්වාදීන් වන අප ප්‍රචණ්ඩත්වය, මානව හිමිකම් උල්ලංඝනය, ජාතිවාදය, ත්‍රස්තවාදය සහ පුද්ගලයාගේ නිදහස යටපත් කිරීම සඳහා විවිධ උත්සාහයන් ගෙන ඇති සහ නියෝජන ප්‍රජාතාන්ත්‍රවාදය පහත දැමීමට කටයුතු කරන අවධියක කොළඹදී රැස්ව,

(අ) සැබෑ ලෙසම නිදහස් සාධාරණ එක්සත් සාමකාමී සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ලබාගත හැක්කේ අධිෂ්ඨානශීලීව, ලිබරල්වාදයේ මූලධර්ම වලට කැපවීම සහ ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී ව්‍යුහයක් තුළින් බවත් පිළිගෙන,

(ආ) ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී සංගමය විසින් ලිබරල්වාදය ඉහළදැමීම සඳහාත්, ශ්‍රී ලංකාව ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රමයක් ලෙස පවත්වාගෙන යාම සඳහාත් කළ දායකත්වය පිළිගෙන.

(ඇ) අපගේ ව්‍යාපාරය විසින් ගෙන යනු ලැබූ ප්‍රගතිය තුළින් ලිබරල්වාදයට යොමුවූ දේශපාලන පක්ෂයක් අවශ්‍ය බව පිළිගෙන,

(ඈ) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ව්‍යවස්ථාව ලෙස හඳුන්වන මෙම ව්‍යවස්ථාව කොළඹදී සම්මත කරගනිමු.

## 01 වන පරිච්ඡේදය
### සාමාන්‍ය

1 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ලිබරල්වාදය වර්ධනය කරන්නාවූද, ඉදිරියට දමන්නාවූද, ආරක්ෂා කරන්නාවූද කාර්යයට කැපවූ ශ්‍රී ලංකාවේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීමට කටයුතු කරන්නාවූ දේශපාලන පක්ෂයකි.

2 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මතවාදය වන්නේ දේශපාලන දර්ශනය තුළ ලිබරල්වාදය ලෙස හඳුන්වන දර්ශනය වන අතර එය තවදුරටත් 1947 ලිබරල් ප්‍රකාශනයටද, 1967 ඔක්තෝබරයේ ඔක්ස්ෆර්ඩ් ලිබරල් ප්‍රකාශනයටද අනුව පිළිගෙන ලිබරල් පක්ෂය, පුද්ගල නිදහසද, පාර්ලිමේන්තු ප්‍රජාතාන්ත්‍රවාදයද, නිදහස් වෙළඳ පොළ ආර්ථිකයද, සුබ සාධන රාජ්‍යයක් සඳහාද කැපවේ. ලිබරල් පක්ෂය සියලූ ආකාරයේ

සාමූහිකවාදයද, අධිකාරිවාදයද, ජාතිවාදයද, පටු ජාතිකවාදයද, රාජ්‍යවාදයද සාමූහිකත්වයද ප්‍රතික්ෂේප කරයි.

3 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ලොව පුරා ලිබරල්වාදීන් සමඟ ජාත්‍යන්තර සහයෝගිතාවය පවත්වාගෙන යන අතර සියලූ රටවල මානවහිමිකම් උල්ලංඝනයටද, ජාතිවාදයටද, සාමූහිකවාදයටද, අධිකාරිවාදයටද එරෙහි වෙයි.

## 02 වන පරිච්ඡේදය

### සාමාජිකත්වය

4 වන වගන්තිය: වයස අවුරුදු 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට මෙම ව්‍යවස්ථාවේ තිබෙන උපලේඛණයේ දක්වා ඇති ලිබරල් මූලධර්ම පිළිගන්නාවූ පක්ෂයේ සමාජික අයදුම්පත මඟින් ඉල්ලුම් කළ හැක. එකී අයදුම්පත පිළිගැනීමෙන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය ලබාගත හැක.

5 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය නිසි ලෙස කැඳවන ලද ජාතික කාරක සභා රැස්වීමකින් සම්මත කිරීමෙන් පමණක් වලංගු වේ.

6 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික කාරක සභාව මගින් සාමාජික අයදුම්පතක් ප්‍රතික්ෂේප කළහොත් එකී තීරණයට එරෙහිව එලෙස ප්‍රතික්ෂේප වූ තැනැත්තා විසින් ජාතික කාරක සභාව ඉදිරියේ පෙනීසිට තම අයදුම්පත පිළිගැනීම සඳහා හේතු ඉදිරිපත් කළ හැක. ඉන්පසු ජාතික කාරක සභාව විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණයවනු ඇත. කෙසේ වෙතත් වෙනත් ජාතික කාරක සභා රැස්වීමක් මගින් එය වෙනස් කිරීමටද පුළුවන.

7 වන වගන්තිය: ජාතික කාරක සභාව විසින් සෑම සාමාජිකයෙකුටම වාර්ෂික සාමාජික මුදලක් හෝ යාවජීව සාමාජික මුදලක් ගෙවීමට නියම කළ හැක.

8 වන වගන්තිය : (අ) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික කාරක සභාවට පත්විය හැක්කේ ස්ථාවර කමිටුවේ සිටින යාව ජීව සාමාජිකයින්ට පමණි. ස්ථාවර කමිටුව යාව ජීව සාමාජිකයින් 40ක් දක්වා සිටිය හැක. ඔවුන් පත් කරනු ලබන්නේ පක්ෂයේ සභාපතිවරයා විසින් ජාතික කාරක සභාවේ අනුමැතියට යටත්වය.

(ආ) ස්ථාවර කමිටුව අවම වශයෙන් වසරකට දෙවතාවක් රැස්විය යුතු අතර එක් රැස්වීමක් වාර්ෂික මහා සම්මේලනයට පෙර මැයි මස මුල් සතිය තුල රැස්විය යුතුය.

(ඇ) ස්ථාවර කමිටුව රැස්වීම පිළිබඳව රැස්වීම පැවැත්වීමට දින 14 කට පෙර ලිපියක් මගින්, දූරකථන මාර්ගයෙන්, විද්‍යුත් තැපෑලෙන් හෝ කෙටි පණිවිඩයක් ලෙස පක්ෂයේ නියෝජ්‍ය මහලේකම් විසින් එහි සාමාජිකයින් දැනුවත් කළ යුතුය.

(ඈ) සෑම ස්ථාවර කමිටු රැස්වීමකම මුලසුන පක්ෂ සභාපති විසින් දැරිය යුතුය.

(ඉ) ස්ථාවර කමිටු සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ නීත්‍යානුකූලව ඉවත් කිරීම තුළින් ඇතිවන පුරප්පාඩුව සඳහා නව සාමාජිකයෙකු පත් කිරීම පක්ෂයේ සභාපති විසින් ජාතික කාරක සභාවේ අනුමැතියට යටත්ව සිදුකළ යුතුය.

9 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලධර්ම හා වගන්ති වලට පටහැනිව කටයුතු කරන සාමාජිකයෙකු හෝ සාමාජිකයන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සභාපතිවරයාට ඉවත් කිරීමේ බලය ඇත. අදාල තීරණය ජාතික කාරක සභාවෙන් අනුමත කළ යුතුය.

## 03 වන පරිච්ඡේදය

### ජාතික කාරක සභාව

10 වන වගන්තිය: ස්ථාවර කමිටුවේ සාමාජිකයින්ගෙන් වාර්ෂික මහා සම්මේලනයේදී ජාතික කාරක සභාවට පහත සඳහන් නිළධාරීන් පත් කරනු ලැබේ. (52 වන වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව)

(අ) සභාපති
(ආ) ජ්‍යෙෂ්ඨ උප සභාපති
(ඇ) උප සභාපතිවරු 04
(ඈ) මහලේකම්
(ඉ) නියෝජ්‍ය මහලේකම්
(ඊ) ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම්
(උ) භාණ්ඩාගාරික
(ඌ) ජාතික සංවිධායක
(එ) කාරක සභිකයින් 04

මෙම 15 දෙනා අතරින් පළමු ජාතික කාරක සභා රැස්වීමේදී පක්ෂයේ නායකයා පත් කරනු ලැබේ. තවද එකී ජාතික කාරක සභාව වෙත නායක, සභාපති සහ මහලේකම්ගේ අනුමැතියෙන් ස්ථාවර කමිටුවේ

සාමාජිකයින්ගෙන් නම් කරනු ලබන තවත් සාමාජිකයින් 06 දෙනෙකු කාරක සභිකයින් ලෙස පත්කරගත හැකිය.

11 වන වගන්තිය: ජාතික කාරක සභාව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රතිපත්ති සකස් කරන පරිපාලන හා මූල්‍ය කටයුතු ගෙන යන ඉහළම මණ්ඩලය වේ. එයට ප්‍රතිපත්ති තීරණය කිරීමටත්, වෙනස් කිරීමටත් පක්ෂය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඕනෑම තීරණයක් ගැනීමටත් හැක. පක්ෂයේ කටයුතු සඳහා අවශ්‍ය යැයි හැඟෙන විට පක්ෂ සභාපතිවරයාට කාරක සභිකයින් පහත තනතුරු සඳහා පත් කිරීමට හැකිය.

අ. ප්‍රචාරක කටයුතු ලේකම්.
ආ. මාධ්‍ය ලේකම්.

12 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික කාරක සභා රැස්වීමක්,මහ ලේකම්,සභාපති හෝ නායක විසින් කැඳවිය හැක. එමෙන්ම ජාතික කාරක සභාවේසාමාජිකයින් 4 දෙනෙකු විසින් මහ ලේකම්වරයාට ඉල්ලීමක් කිරීමෙන් මහ ලේකම්වරයා විසින් කැඳවිය හැක.

13 වන වගන්තිය: ජාතික කාරක සභාව විසින් පක්ෂ ශාඛා පිහිටුවීම, පළාත්, දිස්ත්‍රික් හෝ මැතිවරණ කොට්ඨාශ පළාත් පාලන මට්ටම්ශාඛා පිහිටුවීම අනුමතකළ යුතුය. එමෙන්ම වෘත්තීය සමිති, ශිෂ්‍ය සංගම්, කාන්තා සංගම්, ගොවි සංගම් ආදී සංගම් පිහිටුවිය හැක.

14 වන වගන්තිය: ජාතික කාරක සභාව විසින් දේශපාලන ප්‍රතිපත්ති සහ පරිපාලන ප්‍රතිපත්ති විශ්ලේෂණය කර තීරණය කිරීම සඳහා විශේෂ කමිටු පත්කල හැක.

15 වන වගන්තිය: ජාතික කාරක සභාවේ සියලු තනතුරු පත් කරන්නේ ස්ථාවර කමිටුවේ සාමාජිකයින් අතරින් ය. එසේ උවද සභාපති හා ජ්‍යෙෂ්ඨ උප සභාපති පත් වන්නේ 52 වන වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව ය. ඔවුහු ද, තනතුරු නොදරන සාමාජිකයින් ද ඊළඟ වාර්ෂික සම්මේලනය පවත්වන තෙක් ධූර දරති.

## 04 වන පරිච්ඡේදය

### ජාතික කාරක සභාවේ නිලධාරීන් සහ අනෙකුත් සාමාජිකයින්

16 වන වගන්තිය: (අ) පක්ෂ නායක වාර්ෂික මහා සම්මේලනයෙන් පසු ප්‍රථම ජාතික කාරක සභාවේදී ඡන්දයෙන් පත්කරගත යුතුය.

(ආ) පක්ෂ නායකට නායක ධූරයට අමතරව කාරක සභාවේ වෙනත් තනතුරක්ද දැරිය හැක.

(ඇ) 52 වන වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව පක්ෂ සභාපතිවරයා වාර්ෂික මහා සම්මේලනයේදී තෝරා පත්කර ගනු ලැබිය යුතුය. සභාපතිවරයා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රධාන විධායක නිළධාරියා වේ. දිස්ත්‍රික් කළමණාකාරවරුන්, දිස්ත්‍රික් සංවිධායකවරුන්, පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාස සහ පළාත් පාලන ආයතන කොට්ඨාස සඳහා සංවිධායකයින් පත් කිරීමේ බලය පක්ෂයේ සභාපතිවරයාට ජාතික කාරක සභාවේ අනුමැතියට යටත්ව සිදු කල හැක.

17 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සියලූම රැස්වීම් සභාපතිවරයා විසින් මුලසුන දරනු ඇත.

18 වන වගන්තිය: උප සභාපතිවරු 05 දෙනෙකුට වඩා නොසිටිය යුතු අතර ඔවුහු වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරාගත යුතුය. ඔවුන් අතරින් ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා 52 වන වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව පත්කරනු ලැබේ.

19 වන වගන්තිය: සභාපතිවරයා නොමැති විටක ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා විසින් සභාපතිවරයාගේ කාර්යයන් සහ යුතුකම් ඉටුකළ යුතුය. එමෙන්ම මහ ලේකම්වරයා විසින් පවරනු ලබන විශේෂ කාර්යයන්ද ඉටුකළ යුතුය.

20 වන වගන්තිය: මහලේකම්වරයා වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරා පත්කල යුතුය.

21 වන වගන්තිය: මහ ලේකම්වරයා පක්ෂයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. මහ ලේකම්වරයා ජාතික කාරක සභාවට වගකිව යුතු අතර මහ ලේකම්වරයාට පරිපාලන තීරණ ගැනීමට බලය ඇත. මහලේකම්වරයා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ කාර්යාලය සහ එහි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය පිළිබඳව වගකීම දරයි.

23 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීපක්ෂයේ කිසිම නිලධාරියෙකු තම වගකීමෙන් ඔබ්බට ගිය තීරණ ගැනීමක් හෝ ක්‍රියාකාරකමක් සිදු නොකළයුතුය. එසේ

වුවද ජාතික කාරක සභාවේ අනුමැතිය මත යම් ක්‍රියාකාරිත්වයක යෙදිය හැකි අතර කාලය පිළිබඳ ගැටළුවක් තිබේනම් නායකගේ අනුමැතිය යටතේ සුදුසු පරිදි කටයුතු කල හැක.

24 වන වගන්තිය: නියෝජ්‍ය මහ ලේකම්වරයා වාර්ෂික මහා සම්මේලනයේ ඡන්ද විමසීමකින් පසු තෝරා පත්කල යුතුය.

25 වන වගන්තිය: නියෝජ්‍ය මහ ලේකම්වරයා පක්ෂයේ පරිපාලනය භාර නිලධාරියා වේ. ඔහු සාමාජික ලැයිස්තුව පවත්වාගෙන යා යුතුය. මහ ලේකම් වරයාගේ උපදෙස් මත සාමාජිකයින් වෙත සියලූ දැන්වීම් යැවීම, ජාතික කාරක සභාවේ සාමාන්‍ය රැස්වීම්කැඳවීම,විශේෂ රැස්වීම් කැඳවීම සහ මහ ලේකම්වරයා විසින් පවරන යම් කාර්යයක් ඉටුකල යුතුය. මහ ලේකම්වරයා රටින් බැහැරව සිටින විට එම ධූරයේ සියලූ වගකීම් සහ කාර්යයන් ඔහු විසින් ඉටුකල යුතුය.

26 වන වගන්තිය: මහලේකම්වරයාගේ ධූරය හිස් වූ විටක, අකර්මණ්‍ය වූ අවස්ථාවකදී හෝ විදේශගත වීමකදී නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් මහ ලේකම් ධූරයේ බලතල සහ කාර්යයන් සිදුකරනු ඇත.

27 වන වගන්තිය: භාණ්ඩාගාරිකවරයා වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් තෝරාගත යුතුය.

28 වන වගන්තිය: (අ) භාණ්ඩාගාරිකවරයා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂයේ මුදල් පිළිබඳව වගකියන අතර පක්ෂයේ ගිණුම් පවත්වාගෙන යැමද, ඒවා පවත්වාගෙන යාමට කටයුතු කිරීමද, අරමුදල් එකතු කිරීමේ ක්‍රම සංවිධානය කිරීම සහ ප්‍රගුණ කිරීමද, සිදු කරන අතර බැංකු ගිණුම්, තැන්පත් හා මූල්‍යමය ආයෝජන පිළිබඳව ජාතික කාරක සභාවට වගකිව යුතුය.

(ආ) ජාතික සංවිධායකවරයා වාර්ෂික මහා සම්මේලනයේදී පත්කරගත යුතුය. ජාතික සංවිධායකවරයාට ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා, පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශ සහ දිස්ත්‍රික් මට්ටමින් පක්ෂ සංවිධාන පිහිටුවීමේ බලය ඇති අතර එම සංවිධාන කටයුතු වලදී පකෂ නායක, මහ ලේකම්වරයා සහ සභාපතිවරයා දැනුවත් කළ යුතුය. තවද පක්ෂයේ සම්මන්ත්‍රණ, දේශන, ප්‍රවෘත්ති සාකච්ඡා සහ ජනහමු පැවැත්වීමද,ජාත්‍යන්තර ශාඛා පිහිටුවීමේ බලයද, තරුණ, කාන්තා සහ වෘත්තීය සමිති කටයුතු සංවිධානය කිරීමේ බලයද ඇත.

29 වන වගන්තිය: නිලතල නොදරන සමාජිකයින් 4 දෙනෙකු වාර්ෂික මහා සම්මේලනයේදී ජාතික කාරක සභාවට ඡන්දයෙන් තෝරාපත්කර ගත යුතුය.

30 වන වගන්තිය: නිළතල නොදරන ජාතික කාරක සභා සාමාජිකයින්ට, ජාතික කාරක සභාව විසින් විශේෂ තනතුරු හෝ වගකීම් පැවරිය හැක.

31 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික කාරක සභාවේ තනතුරක් දැරීමට අපේක්ෂා කරන ස්ථාවර කමිටු සාමාජිකයෙකුට ඒ සඳහා ඔහුගේ කැමැත්ත අවශ්‍ය වන අතර ඔහුගේ නම තවත් සාමාජිකයන් දෙදෙනෙකු විසින් යෝජනා ස්ථිර කර තිබිය යුතුය. එකී නාම යෝජනාව වාර්ෂික සම්මේලනය පැවැත්වීමට දින 14 කට පෙර පක්ෂයේ මහ ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපැලෙන් පමණක් ඉදිරිපත් කළ යුතුය.

32 වන වගන්තිය:

(අ) සභාපති, මහලේකම්, ජාතික සංවිධායක, නියෝජ්‍ය මහලේකම්, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම්, භාණ්ඩාගාරික, ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරයන් සඳහා එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ උප සභාපති ධූරයට තැනැත්තන් 4 දෙනෙකුට වැඩියෙන් නාම යෝජනා ලැබුනහොත් එම සාමාජිකයින්ට වාර්ෂික මහා සම්මේලනයේදී තම අපේක්ෂකත්වය තහවුරු කරමින් අදහස් ප්‍රකාශ කළ හැක. සාමාජිකයෙකුට ඉල්ලුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි. (52 වන වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව)

(ආ) පක්ෂයේ නායක හෝ ඔහු/ඇය විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයකු තේරීම්භාර නිලධාරි ලෙස කටයුතු කල යුතුය.

34 වන වගන්තිය: ජාතික කාරක සභාවේ නිල දරණ හෝ නිල නොදරන සාමාජිකයෙකුගේ ධූරය මරණය, ඉල්ලා අස්වීම හෝ විශේෂ මහ සභා රැස්වීමකදි කරනු ලබන යෝජනා සම්මතයක් මත හෝ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ සාමාජිකත්වය නතර වුවහොත් හිස්වේ.

35 වන වගන්තිය: ජාතික කාරක සභාව ගත් තීරණයක්, ඉන් පසු රැස්වන ජාතික කාරක සභාවකදී බහුතර කැමැත්ත මත ආපසු වෙනස් කළ හැක.

## 05 වන පරිච්ඡේදය

### වාර්ෂික මහා සම්මේලනය හා විශේෂ මහා සභා රැස්වීම්

36 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂයේ වාර්ෂික මහා සම්මේලනය සෑම වර්ෂයකම ජූනිමාසයේදී පැවැත්විය යුතුය.

37 වන වගන්තිය: වාර්ෂික මහා සම්මේලනය පවත්වන දිනය ජාතික කාරක සභාවේදී තීරණය කළ යුතු අතර නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් වාර්ෂික මහා

සම්මේලනය පවත්වන්නට යෙදෙන දිනට දින 21 කට පෙර සාමාජිකයින්ට දැනුම්දිය යුතුය.

38 වන වගන්තිය: සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන යෝජනා වාර්ෂික මහා සම්මේලනය පවත්වන දිනට දින 14 කට පෙර මහ ලේකම්වරයා හෝ නියෝජ්‍ය මහ ලේකම්වරයා වෙත ලිඛිතව දැන්විය යුතුය.

39 වන වගන්තිය: මහ ලේකම්වරයා සමඟ එකඟව නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් වාර්ෂික මහා සභා සම්මේලනයේදී විවාද කරනු ලැබීමට නියමිත යෝජනා ද තනතුරු අපේක්ෂක ලැයිස්තුවේ පිටපත් අවම වශයෙන් සම්මේලනයට දින 7 කට පෙර සාමාජිකයින්ට ලැබීමට සැලැස්විය යුතුය.

40 වන වගන්තිය: වාර්ෂික මහා සම්මේලනයේ මුලසුන දැරීම සභාපතිවරයා විසින් කරනු ලබයි. සභාපතිවරයා නොමැති විටක ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා විසින්ද, ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා ද නොමැති නම් මහලේකම්වරයා විසින් ද එහි මුලසුන දරණු ඇත.

41 වන වගන්තිය: සභාපතිවරයා විසින් හෝ මුලසුන දරණ නිලධාරියා විසින් සියලු පටිපාටිමය ප්‍රශ්ණ විසදිය යුතු අතර විවිධ මත සහ අදහස් වලට සවන්දීමෙන් පසු අවශ්‍ය තීරණ ගත යුතුය.

42 වන වගන්තිය: වාර්ෂික මහා සම්මේලනයේදී සභාපතිවරයා හෝ මුලසුන දරණ සාමාජිකයා විසින් ගනු ලබන කාර්යය පාටිපාටික තිරණයක් පිළිබඳව සාමාජිකයන් විසින් ප්‍රශ්න කළ හැක.

43 වන වගන්තිය: සාමාජිකයින් විසි දෙනෙකුගේ (20) කැමැත්ත මත වාර්ෂික මහා සම්මේලනයේදී විශේෂ දේශපාලන යෝජනාවක් සාකච්ඡා කර තිරණය කළ හැක.

44 වන වගන්තිය: (අ) පක්ෂ නායක විසින් වාර්ෂික මහා සම්මේලනය ඇමතිය යුතුය.

(ආ) පක්ෂ මහ ලේකම්වරයා විසින් පසුගිය වසරක කාලය සඳහා පක්ෂය ගෙන ගිය වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් සහ පක්ෂයේ ඉදිරි කටයුතු පිළිබඳව සුදුසු යැයි සැලකෙන කරුණු සම්මේලනය වෙත ඉදිරිපත් කල යුතුය.

45 වන වගන්තිය: භාණ්ඩාගාරික විසින් පසුගිය මුල්‍ය වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු අතර පක්ෂයේ ඉදිරි මුදල් කටයුතු පිළිබඳ තම අදහස් ඉදිරිපත් කළ හැක.

46 වන වගන්තිය: සාමාජිකයන් විසින් නිලතල දැරූ සාමාජිකයන් වෙත ඔවුන්ගේ කාර්යයන් ඉටුකළ ආකාරය පිළිබඳව ප්‍රශ්න ඉදිරිපත්කළ හැක.

47 වන වගන්තිය: සභාපතිවරයා සහ මහලේකම්වරයාගේ එකඟතාවය මත නියෝජ්‍ය මහලේකම්වරයා විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක.

48 වන වගන්තිය: දේශපාලන කරුණක් සාකච්ඡා කිරීම සඳහා ස්ථාවර කමිටුවේ සාමාජිකයින් විසිදෙනකු (20) විසින් සභාපතිවරයාට හෝ මහලේකම්වරයාට දැනුම්දීමෙන් විශේෂ මහා සභා රැස්වීමක් ඉල්ලුම් කල හැක.

49 වන වගන්තිය: විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට දින පහකට පෙරවත් ඒ පිළිබඳව ජාතික පුවත්පත් දෙකකවත් දැන්වීමක් පලකිරීමට නියෝජ්‍ය මහලේකම්වරයා කටයුතු කළ යුතුය.

## 06 වන පරිච්ඡේදය
### විශේෂ කරුණු

50 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ සලකා බලා නොමැති කරුණක් ජාතික කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

51 වන වගන්තිය: මෙරට පවත්වන මැතිවරණයකදී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් නාම යෝජනා ලබාදී මන්ත්‍රී ධූරයක් ලබන අයෙකුට කුමන හේතුවක් මතවත් පක්ෂය වෙනස් කිරීම, පක්ෂයේ ජාතික කාරක සභාවේ අනුමැතියකින් තොරව වෙනත් පක්ෂයකට හෝ කණ්ඩායමකට සහයෝගය පළ කිරීම, පක්ෂයේ සාමූහික තීරණවලින් හාහිරව ස්වාධීනව කටයුතු කිරීම කළ නොහැකි අතර එවැනි අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අහෝසි කිරීමට හේතුවනු ඇත.

## 07 වන පරිච්ඡේදය
### අන්තර්කාලීන විධිවිධාන

52 වන වගන්තිය: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ 2024 ජූලි මස 20 දිනට ධූරය දරණ සභාපතිවරයා සහ 2024 ජූලි මස 20 දිනට පසු පවත්වන ජාතික කාරක සභාවේ අනුමැතියෙන් යෝජනා සම්මත වීමෙන් පත්වන ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා එම ධූරයෙන් ඉවත්වන තෙක් පක්ෂයේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරයන් දරණු ඇත. මෙම සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා එම ධූරයන්ගෙන් ඉවත්වූ වහාම ඊළඟ ජාතික කාරක සභාවේදී වැඩ බලන සභාපතිවරයෙකු සහ වැඩ බලන ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙකු පත්කළ හැක. ඉන්පසු එළඹෙන වාර්ෂික මහා සම්මේලනයේදී පුරප්පාඩු වූ සභාපතිධූරය හෝ ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය සඳහා ස්ථාවර කමිටුවෙන් සාමාජිකයෙකු ඡන්දයෙන් පත්කර ගත යුතුය.

ඉදිරියට සභාපතිධූරය සහ ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය සඳහා පත් කිරීම වාර්ෂික මහා සම්මේලනයේදී ඡන්දයෙන් සිදුකළ යුතුය.

## 08 වන පරිච්ඡේදය
### ව්‍යවස්ථා සංශෝධන

53 වන වගන්තිය: ඕනෑම සාමාජිකයෙකුට මහ ලේකම්වරයා වෙත හෝ නියෝජ්‍ය මහ ලේකම්වරයා වෙත යවනු ලබන ලිඛිත නිවේදනයක් මගින් ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කළ හැක.

54 වන වගන්තිය: (අ) එකී යෝජනාව සම්බන්ධයෙන් ජාතික කාරක සභාවේ තීරණය මත අදාල ව්‍යවස්ථා සංශෝධනය සඳහා මහ ලේකම් වරයාගේ එකඟතාවය මතනියෝජ්‍ය මහ ලේකම්වරයා අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි වන අතර ඒ පිළිබඳව දින 21 කට පෙර සාමාජිකත්වයට දැනුම් දිය යුතුය.

(ආ) නියෝජ්‍ය මහ ලේකම්වරයා විසින් මහ ලේකම්වරයා දැනුවත් කර එකී ව්‍යවස්ථා සංශෝධනයේ පිටපතක් එකී අති විශේෂ මහා සභා රැස්වීමට දින 14 කට පෙර සාමාජිකයන් වෙත යැවිය යුතුය.

55 වන වගන්තිය: අති විශේෂ මහා සභා රැස්වීමේදී 1 වන පරිච්ඡේදයේ වගන්ති හැර ව්‍යවස්ථාවේ ඕනෑම වගන්තියක් සංශෝධනය කළ හැක.

56 වන වගන්තිය: මෙම ව්‍යවස්ථාවේ 1 වන පරිච්ඡේදය වගන්ති හා පළමු උපලේඛණයේ වගන්ති වාර්තාගත සාමාජිකයන්ගෙන් සියයට 75 ක්ද, නායකයාද, සභාපති සහ මහ ලේකම්වරයාද සහභාගි වීමෙන් හැර සංශෝධනය කළ නොහැක.

## උපලේඛනය

පහත අත්සන් කරන මම ලිබරල්වාදයේ ප්‍රතිපත්ති පිළිගන්නා අතර පෞද්ගලික නිදහස, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ සුභ සාදක රාජ්‍ය මත පදනම් වූ නිදහස් අලෙවි ආර්ථිකය සහ ජාතිවාදය, වර්ගවාදය, කුලවාදය, ආගම්වාදය, පවුල්වාදය, ප්‍රභූවාදය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ලිංගිකත්වය හෝ පංතිවාදය ආදී සාධක වලින් තොර නිදහස් හා සාධාරණ ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමට කැප වන බව පැහැදිලිව ප්‍රකාශ කරමි. එහෙයින් මම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය ලැබීමට කැමැත්තෙමි.

### මුල් ව්‍යවස්ථාව

- වර්ෂ එක්දහස් නවසිය අසූහතක් වූ ජනවාරි මස දහනව වන සඳුදා මෙම ව්‍යවස්ථාව කොළඹදී සම්මත කරගන්නා ලදි.

## අන්තර් සංශෝධන

සංශෝධනය I

- වර්ෂ 2022 ක් වූ මැයි මස 22 වන ඉරුදින කොළඹදී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේදී ව්‍යවස්ථාව සංශෝධනය කර සම්මත කරගන්නා ලදි.

සංශෝධනය II

- වර්ෂ 2024 ක් වූ ජූලි මස 20 වන ශනිදා දින පමුණුගමදී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේදී මෙම ව්‍යවස්ථාව සංශෝධනය කර සම්මත කරගන්නා ලදි.

2024.07.20

නීතිඥ අමල් ඒ. රන්දෙනිය
මහ ලේකම්
ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
583, කා.ජුඩ් මාවත, කඳාන.